KIDS GOD WORSHIP
www.kidworship.kr

# සාකෙවුස්

−Zacchaeus−



83Page

**පොතේ ගුරා** සාකෙවුස් නම් ප්‍රධාන බදු අය කරන්නෙක් යෙරුකෝව නම් නගරයේ සිටියා. එයා ගොඩාක් මිටි මිනිසෙක්. බදු අයකැමියන් මිනිසුන්ගෙන් බදු අයකරගන්නවා. සාකෙවුස්, පොහොසත් අයගෙන් පමණක් නොව, බලාත්කාරයෙන් දුප්පත් අයගෙන් පවා බදු අයකරගන්නට සූරයෙක්. ඒ නිසාම මිනිසුන් එයාට හරිම අකමැතියි. ඔහුට පව්කාරයෙක් කියා ඇමතුවා.

.........................................................................................................



84Page

**පොතේ ගුරා** මේ ආකාරයෙන් මිනිසුන් සාකෙවුස් ව එපා කළාට, ඔහු වැඩි වැඩියෙන් මිනිසුන්ගෙන් බදු අය කළා. වැඩි වැඩියෙන් මිනිසුන්ට කරදර කළා.

**සාකෙවුස්** හුහ්... ඔයාගෙන් මට සතපහකටවත් වැඩක් නෑ! අනිවාර්යෙන්ම මේ ලෝකයේ තියෙන වැදගත්ම දේ තමයි මුදල්.. මුදල්..! ඔයාලා මගේ උස ගැන විහිලු කරන්න හිතන්නවත් එපා. මම ඒකට ඉඩ දෙන්නේ නෑ !!

**පොතේ ගුරා** සාකෙවුස් වටේටම ගිහින් මිනිසුන්ට කරදර කරන්න පටන්ගත්තා. ඇත්තටම ඒක එයාගේ රැකියාව වුණා.

**සාකෙවුස්** ඔයගොල්ලන්ගේ බදු ගෙවනවා.! මේ දැන් මේ දැන්ම ඒක ගෙවනවා !

**පළමු මිනිසා** අනේ කරුණාකරලා මට තව දවස් කිහිපයක් දෙන්න පුලුවන්ද? මේ මාසයේ අපේ දරුවන්ට කන්න දෙන්න අපිට තියෙන දේත් මදි. කරුණාකර අපට තව ටික කාලයක් දෙන්න.

**සාකෙවුස්** ඒකට මම මොනව කරන්නද? ඔයාලට මුදල් නැත්නම් මට ඔයාලගේ ධාන්‍ය හරි දෙන්න. නැත්නම් මම ඔයාලව මේ දැන්ම හිරගෙට දානවා.

**පොතේ ගුරා** මෙන්න මේ ආකාරයෙන් සාකෙවුස් මිනිසුන්ගෙන් බදු අය කරලා ගොඩාක් පොහොසත් මිනිසෙක් වුණා. හැමෝම සාකෙවුස්ට වැඩි වැඩියෙන් වෛර කළා. ඒ නිසා ඔහු තනිවුණ මිනිසෙක්ව සිටියා.

.........................................................................................................



85Page

**පොතේ ගුරා** ඔන්න එක දවසක්දා යේසුස්වහන්සේ යෙරුකෝවට ආවා. අනෙක් නුවරවල්වල යේසුස්වහන්සේ රෝගීන් සුව කිරීම ගැනත්, දේවරාජ්‍ය ගැන දේශනා කිරී

ගැනත් සාකෙවුස් අසා තිබුණු නිසා, ඔහුට යේසුස්වහන්සේ ව දකින්න කුතුහලයක් ඇති වුණා.

**සාකෙවුස්** මේ යේසුස්වහන්සේ කවුද දන්නේ නෑ ? මමත් යන්න ඕන යේසුස්වහන්සේ බලන්න.

**පොතේ ගුරා** සාකෙවුස් පරක්කු කරන්නේ නැතිව ඉක්මණින්ම යේසුස්වහන්සේ බලන පිණිස ගියා. ඒත් ඒ වෙනවිටත් රැස්වී සිටි සෙනග නිසා යේසුස්වහන්සේ ළඟට යන්න ඔහුට නොහැකි වුණා.

.........................................................................................................



87Page

**සාකෙවුස්** මිම්මි ... මම මොනවද කරන්නේ.. මම තව ටිකක් උස වුණා නම් යේසුස්-වහන්සේව මට බලන්න තිබුණා. ආ... අන්න හරි...

**පොතේ ගුරා** සාකෙවුස්ට අදහසක් ආවා..

**සාකෙවුස්** හේ... හෝ... හේ... නගිමු නගිමු. ආහ්.. මම මේ අත්තික්කා ගහට නැංගොත් මට යේසුස්වහන්සේව බලන්න පුලුවන්.

**පොතේ ගුරා** සාකෙවුස්ට ගහ උඩ ඉදන් යේසුස්වහන්සේව බලන්න පුලුවන් වුණා.

**සාකෙවුස්** ආහ්.. අර සුදුපාට ඇඳගෙන ඉන්න කෙනා යේසුස්වහන්සේ වෙන්න ඕන.

**පොතේ ගුරා** සකෙවුස් යේසුස්වහන්සේ දෙස බලමින් ඉද්දී යේසුස්වහන්සේ නතරවෙලා අත්තික්කා ගහ උඩ බලලා සාකෙවුස්ට කතා කරනවා.

**යේසුස්වහන්සේ** සාකෙවුස් මේ දැන්ම ගහෙන් බැහැලා එන්න. මම අද ඔයාගේ ගෙදර එන්න ඕන.

**පොතේ ගුරා** යේසුස්වහන්සේ සාකෙවුස්ට කතා කළේ හරියට කලින් ඉඳලාම දන්න හඳුනන යාලුවෝ වගේ. සාකෙවුස් එවලෙහිම බැස ඇවිත් යේසුස්වහන්-සේව සතුටින් පිළිගත්තා.

**පොතේ ගුරා** ඒත් මිනිසුන් මේක දැකලා කොඳුරන්න පටන් ගත්තා.



88Page

**දෙවන මිනිසා** යේසුස්වහන්සේ මේ වගේ පව්කාරයෙක්ගේ ගෙදර යන්නේ !කොහොමද?

**තුන්වන මිනිසා** ඇත්තටම ! සාකෙවුස් හරි ආත්මාර්ථකාමියි නේ.

**පොතේ ගුරා** ඒත් යේසුස්වහන්සේ මේ අය කීව දේවල් ඇහුවේ නෑ. සාකෙවුස් මුලු හදවතින්ම යේසුස්වහන්සේ පිළිගෙන මෙහෙම කීවා.

**සාකෙවුස්** ස්වාමිනි ! මේ දැන්ම මම මට අයිති දේවල්වලින් භාගයක්ම දුප්පතුන්ට දෙනවා. මම කාටහරි වංචා කර ඇත්නම්, හතරගුණයක් ඒ අයට ගෙවනවා.

**යේසුස්වහන්සේ** සාකෙවුස් ! අද මේ ගෙදරට ගැළවීම ආවා. මම ආවේ නැති වූ දේ සොයන්ටත් ගළවා ගන්නත් ය.

.......................................................................................................



89Page

**පොතේ ගුරා** සාකෙවුස් තමන් කී ලෙසටම පොරොන්දුව කඩ නොකර, එයා හම්බකර ගත් දෙයින් භාගයක් දුප්පතුන්ට දුන්නා. යේසුස්වහන්සේ මුණගැසීමෙන් පසුව සාකෙවුස් සම්පූර්ණයෙන්ම වෙනස් අලුත් කෙනෙක් බවට පත් වුණා.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, යේසුස්වහන්සේ පව්කාර අයගේ නිවෙස්වල ගිහින් කෑම කන්නත් කැමති වුණා. ඒ නිසා අපිත් වැරදි වැඩ කරන මිනිසුන්ව කොන් කරන්න නොකරමු. ඒ අයවත් අපි අපේ නිවෙස්වලට ආරාධනා කරමු. යේසුගේ ආදරය කියා දෙමු.